# රිටිගල ආරාම සංකීර්ණයේ පධානඝර ආශ්‍රිත වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ

**මන්දාරම්නුවර චන්දානන්ද හිමි**

පුරාවිද්‍යා නිළධාරි, මධ්‍යම සංස්කෘතික අරමුදල.

**Abstract**

More than 15 monastery complexes with double platform residences have been reported in the country so far. Double platform residences bear a resemblance in design features, while in some places double platform residences with minor variations can also be seen. Ritigala is one such place. The moat, a key feature of the Double Platform Residences, is absent from the Ritigala Double Platform Residences. Stone bridges have been used at several locations to protect the concept of some of the double platform residences in Ritigala, but the existence of moats cannot be confirmed. Even double-platform residences, such as Tiriyaya, which have been drafted with information about the trenches that bring water to the moat, need to study in depth how the context of the double-platform residences at Ritigala has changed in the background that is now clearly identified. Double platform residences, which are connected to the ground as a staircase instead of stone bridges, are also capable of showing that difference. In addition to the dual platform, two double platform residences with another small building can be seen in Ritigala. It is also a new addition to the basic concept. Another specialty here is the construction of the building on the tam behind several double platform residences. Such constructions are not common to all locations with double platform residences, but are characteristic of a handful of locations, such as Manakanda. Due to the ecological nature of Ritigala, it is in a cool environment and it is necessary to inquire whether they have been slightly modified. If it had changed due to that nature, a change of architectural elements would have been to be expected in such a context. It is noteworthy that the architect has even worked to preserve the creative quality by using decorative mortar. An example of the fine architecture that can be seen here is the design of the building in line with the environment, free

from the tradition of changing the environment as required to design the building. In addition to the nature of these features, it is also special to see all the stone urinals and toilets associated with this place. Among the constructions here are the technical techniques used to connect the slabs to each other, and the application of large stone slabs leveled to certain double platform residences has increased its symbolic value.

*Key Word*: monastery complexes, Ritigala, Double Platform, architect.

**හැඳින්වීම**

උතරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කීරියගස්වැව ග්‍රාම නිලධාරී වසමේ මෙම ස්ථානය පිහිටා ඇත. මෙහි ගෝලීය ස්ථානගත පිහිටීම - N 8º, 0º – 8º, 9º, E 80º, 38º – 80º, 40º වේ. රිටිගල පුරාවිද්‍යා පරිශ්‍රය අනුරාධපුර නගරයේ සිට 43 km දුරින් පිහිටි අනුරාධපුර අවදියට අයත් පුරාවිද්‍යාත්මක අවශේෂ සහිත බෞද්ධ ආරාම සංකීර්ණයකි. මෙම ආරාම සංකීර්ණයේ පනහකට ආසන්න ප්‍රමාණයක් පධානඝර දැකිය හැකි අතර, ඒවායේ වාස්තුවිද්‍යාත්මක ස්වරූපය කවරේද යන්න අධ්‍යයනය මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණ වේ. එහි දී පධානඝරය කෙසේ සකස් විය යුතු ද යන්න පෙළෙහි ඇති ආකාරයත්, ඒවා ලංකාවේ වෙනත් ස්ථානවල වාස්තුවිද්‍යාත්මක ව කෙසේ සැළසුම් කර ඇද්ද යන්නත් රිටිගල පධානඝර ඒවායින් වෙනස් වන්නේ කෙසේද යන්නත් මෙහිදී අධ්‍යයනය කෙරේ. මෙහි මුල් කොටසේ වැඩි ඉඩක් පධානඝරයක මූලික සංකල්ප හඳුන්වාදීම විෂයයෙහි වෙන් කිරීමට අපේක්ෂිත ය.

**සාකච්ඡාව**

පොළොන්නරු රාජධානි සමයේ මුල් අවදියේ සිදු වූ චෝල ආක්‍රමණ හේතුවෙන් රිටිගල ආරාම සංකීර්ණය විනාශ වූ බවට සැළකේ (අලහකෝන් 2002: 1). මෙහි දැකිය හැකි විශේෂතම ඉදිකිරීම් වන්නේ පධානඝර ය. පධානඝර යනු භික්ෂු ආවාස විශේෂයකි. භාවනා කිරීම සඳහා භාවිත කොට ඇත. එය ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ අර්ථ විවරණය කොට ඇත්තේ "කෙලෙස් තැවීම සඳහා භාවනා කරන ගෘහය"වශයෙනි (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය 1952: 514).

මහාචාර්ය එම්. ඩබ්. විමල් විජේරත්න මහතා, පධානං පදහති යන පාලි පාඨය මුල්කොට ගනිමින් පධානඝර යන්න අර්ථ දක්වන්නේ "සමුච්ඡේද ප්‍රහානයෙන් ක්ලේෂයන් පුළුස්සාහරින ස්ථානය" වශයෙනි (අමරසේකර 2013: පෙරවදන). මේ සඳහා සුදුසු ස්ථානයක් සපයා ගත යුතු බව "පතිරූපදේසවාසෝ ච" බුද්ධ දේශනය යි (මහාමංගල සූත්‍රය). පධානඝරය සීත වූ තැනකි. (පධානඝරස්මින්ති පධාන මනුයුත්තානං සීතඝානභූතෙ ඝරෙ) (සාරත්ථ දීපිකා නම් රසවාහිනී ටීකා 1907:77) එසේ ම මහාචාර්ය එම්. ඩබ්. විමල් විජේරත්නයෝ මෙම ද්විත්ව වේදිකා ගොඩනැගිල්ලෙන් එකක් විපස්සනා ධුරය වැඩීමටත් අනෙක ග්‍රන්ථධුරය වැඩීමටත් භාවිත වූ අතර ගලක් මතුපිට දියඅගලකින් වට වන සේ නිර්මාණය කිරීමට හේතුව වේයන් මීයන්ගෙන් ආරක්ෂා කර ගැනීමට බවත් පුස්කොළ පොත් ජල වාෂ්ප මගින් අධික වියලීම නැවැත්වීමට බවත් නව මතයක් ගෙනහැර දක්වයි (සම්මුඛ සාකච්ඡා). ද්විත්ව ගොඩනැගිල්ලේ විශාල කොටස භාවනා

කිරීම සඳහාත්, කුඩා කොටස ටීකා, අට්ඨකථා ප්‍රකරණ ආදී ග්‍රන්ථ පරිසීලනය කිරීමටත් භාවිත වූ අතර, විදර්ශනාධුරය වැඩීම ග්‍රන්ථධුරය වැඩීමට සාපේක්ෂව අවධානය අඩු බැවින් අඩු ඉඩක් මගින් එය සංකේතවත් කළ බවත් දක්වයි (එම). පධාන යනු කෙළෙස් තැවීම යි. සර යනු ගෙය වේ. ඒ අනුව කෙළෙස් තවන ගෙය පධානඝරය වේ (බුද්ධදත්ත හිමි 1998: 306).

තපෝවනාරාම, ද්විත්ව වේදිකා ගොඩනැගිලි යන නම්වලින් හඳුන්වනු ලබන්නේ ද මෙම පදානඝර ම ය. මෙම ගොඩනැගිලි විශේෂය පිළිබඳ ව චුල්ලවග්ගපාලියේ ද සඳහන් ව ඇත (19 අධෝ ලිපිය බලන්න) මහාවිහාරයෙන් බිඳී ගිය භික්ෂු පිරිසක් මේවායෙහි වැඩ විසූ බවට ද අදහසක් පවතී (ගුණවර්ධන 2010: 34). දැනට ශ්‍රී ලංකාවෙන් හමු වී ඇති පැරණිතම පධානඝරය සේ සැළකෙන්නේ වෙහෙරබැඳිගල පධානඝරය යි. එය ක්‍රි.ව. 3-6 සියවස් අතරට අයත් බවට මත පවතී. ලක්දිව අනුරාධපුර බටහිරාරාම, අරන්කැලේ, වෙහෙරබැඳිගල, කිරලාගල, යන ස්ථානවල මෙම වර්ගයට අයත් ගොඩනැගිලි දැකිය හැකිය. මෙම ගොඩනැගිලි විශේෂය ලක්දිව අනුරාධපුර කාල සීමාව තුළ පමණක් වීම විශේෂ ය. වෙන ම ඉදිකළ චතුරස්‍රාකාර කාමර දෙකක් ශිලා පාලමක් (ඒදණ්ඩක්) මගින් සම්බන්ධ කොට තිබීම හා ගොඩනැගිල්ල වටා දිය අගලක් නිර්මාණය කොට පැවතීම මෙහි ආකෘතික ලක්ෂණ වේ.

පධානඝර කාල නිර්ණය කිරීමේ දී හොකාර්ට් ක්‍රිස්තු වර්ෂ තුන්වැනි සියවසේ පධානඝර ආරම්භ වන බවට මත පළකරන අතර, 06 වැනි සියවසින් අවසන් වන බව පිළිගැනීම වේ. මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතා පධානඝර ක්‍රිස්තු වර්ෂ 05 න් ඇරඹී 10 න් අවසන් වන බව ප්‍රකාශ කරයි (Bandaranayeke 1974: 130). රිටිගලට අමතර ව අනුරාධපුර මහාවිහාර පධානඝරය, අභයගිරියේ සුදස්සන පධානඝරය, අනුරාධපුර ථූපාරාම පධානඝරය, නාගොල්ල පධානඝර, මුල්ලේගල, මානාකන්ද, වෙහෙරබැඳිගල, මැණික්දෙණ, නුවරගල්කන්ද, කිරලාගල, අරන්කැලේ, බුදුගල, ගල්බැඳිවිහාරය, සිවුලුකන්ද, මිහින්තලේ කළුදියපොකුණ, අනුරාධපුර කටුකැලියාව, තන්තිරිමලේ ආදිය ලක්දිව පධානඝර අතරින් කිහිපයකි. ආරාමයන්හි ඇති ආරාමාංග පිළිබඳ අවධානය යොමු කරන විට,

01. අඩ්ඪයෝග (ගුරුළු පියාපත් වැනි වහළක් ඇති ගොඩනැගිලි), 02. පාසාද (ආයත චතුරස්‍රාකාර ගොඩනැගිලි), 03. හම්මිය (සඳළු සහිත ගෙය), 04. ගුහා (ලෙන් වැනි වාසස්ථාන), 05. පරිවෙණ (කාමර වශයෙන් වෙන් වූ කුටි) , 06. කොට්ඨක (ගබඩා ගෙය), 07. උපට්ඨාන සාලා (උවැටැන්හල්), 08. අග්ගිසාලා (ගිනි දල්වන ගෙය), 09. කප්පිය කුටි (කැපකරු කුටි), 10. චංකමණ (සක්මන්හල), 11. චංකමණ සාලා (සක්මන් හල), 12. උදපාන (පානීය ළිඳ), 13. උදපාන සාලා (පානීය ළිංහල), 14. ජන්තාඝර (උණුපැන් ගෙය), 15. පොක්ඛරණී (පොකුණ), 16. මණ්ඩප (මණ්ඩපය), 17. ආරාම (සියලු අංගවලින් සමන්විත විහාර), 18. ආරාම වත්ථු (ආරාම වත්ත)

යන ඒවා සංඝයා වහන්සේලාගේ පහසුව තකා ඇති ආරාම හා බැඳි අ ානුසාංගිකාංග වේ. මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතා පධානඝර (බටහිරාරාම සංකීර්ණය) වර්ග පහකට කොටස් කර දක්වයි.

01. ප්‍රාථමික සංඝාරාම

02. රළු ගල්වලින් කරන ලද ප්‍රාකාරයක්, ද්විත්ව වේදිකා ගොඩනැගිල්ලක්, ප්‍රධාන දොරටුව ආශ්‍රිත ද්වාර මණ්ඩපයක්

03. ගඩොල් ප්‍රාකාරය, ද්විත්ව වේදිකා ගොඩනැගිල්ල, ප්‍රධාන දොරටුව ආශ්‍රිත ද්වාර මණ්ඩපයක්

පධානඝර ඉදිකිරීම් ශිල්පය කොටස් පහකට බෙදා දක්වමින් මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතා වර්ගීකරණයක් ඉදිරිපත් කරයි.

01. ගල් කැබලිවලින් තැනූ පාදම සහිත කුටි

02. මතුපිට රළු ලෙස සකසන ලද ගල් යෙදූ ගොඩනැගිලි

03. සරල සමතල මතුපිටසහිත ගල් යෙදූ ගොඩනැගිලි

04. සරල සමතල මතුපිට සහිත ගල් යෙදූ ගොඩනැගිලි, කුටි රහිත ප්‍රාසාද සහිත ගොඩනැගිලි

05. නෙලන ලද ගල්වලින් තැනූ ප්‍රාසාද සහිත ගොඩනැගිලි (Bandaranayeke 1974: 130 අමරසේකර 2013ඃ 41)

මහාවිහාර අභයගිරි හා ජේතවන විහාරයෙහි ග්‍රන්ථධුර (ත්‍රිපිටක ධර්මය, භාෂා ශාස්ත්‍ර ඉතිහාස රාජනීති, වෛද්‍ය ශාස්ත්‍ර ආදිය උගැන්ම) හා විදර්ශනා ධුරය (නිර්වාණාවබෝධය අරමුණු කොටගත් භාවනා) වැඩූ භික්ෂූන් වහන්සේලා වැඩහුන් අතර, විවිධ ධුතාංග සමාදන් වූ භික්ෂූන් වහන්සේලා ද ඒ අතර විය. (පාංශුකූලිකාංග (පාංශුකූල සිව්රු දැරීම, තෙචීවරිකාංග (සංඝාටි, උත්තරාසංඝ හා අන්තරවාසක යන සිව්රු දැරීම), පිණ්ඩපාතිකාංග (පිණ්ඩපාතයෙන් යැපීම), සපදානචාරිකාංග (ගෙපිළිවෙළින් පිඬු සිඟායෑම), ඒකාසනිකාංග (වේලකට වරක් පමණක් වැළඳීම), රුක්ඛමූලිකාංග (ගස් යට පමණක් වාසය), අබ්භෝකාසිකාංග (එළිමහනේ පමණක් වාසය), සෝසානිකාංග (සොහොන්වල වාසය කිරීම), යථාසන්තතිකාංග (කෙනෙක් වෙනුවට සෙනසුනේ වැඩවිසීම), නේසජ්ජිකාංග (නොනිඳා හිඳගෙන පමණක් විසීම), ඛලුපච්ඡාභත්තිකාංග (පක්ෂි විශේෂයකගේ තුඩින් වැටෙන ගෙඩි පමණක් ආහාරයට ගැනීම), ආරඤ්ඤිකාංග (ගම්මානයෙන් දුනු පන්සීයක් ඈත වනයේ විසීම), පත්තපිණ්ඩිකාංග (එක පාත්‍රයක පමණක් පාත්‍රයේ දන් වැළඳීම) (සිංහල විසුද්ධිමාර්ගය ධුතාංග නිර්දේශය, 95) ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා යනු ධුතාංගයක් සමාදන් වූ භික්ෂූන් වහන්සේලා බව ඒ අනුව ඉතා පැහැදිළි ය. එසේ ම පාංශුකූලිකාංගය සමාදන් වූ භික්ෂූන් වහන්සේලා විසින් විසිතුනක් පමණ වූ ලක්ෂණ දරන රෙදි කැබලි චීවර සඳහා භාවිත කළ යුතු බව අටුවාවෙහි සඳහන් වේ. සොසානික (සොහොනෙන් ගත් වස්ත්‍ර), පාපණික (කඩ සාප්පු ඉදිරියේ දමා ගිය වස්ත්‍ර), රථියචෝලය (පින් කැමැත්තවුන් විසින් කවුළුදොරින් විසිකරන ලද වස්ත්‍ර), සංකාරචෝලය (කසලගොඩට දැමූ වස්ත්‍ර), සොත්ථිය (ස්ත්‍රීන්ගේ ගැබ් මළ පිසදමා ඉවත දැමූ වස්ත්‍ර), නහානචෝලය (යකදුරන් විසින් හිස පටන් නාවන ලද්දවුන් විසින් කාලකණ්ණිකඩ යනුවෙන් ඉවත දැමූ වස්ත්‍ර), තිත්ථචෝලය (නහන තොට ඉවත් කොට ඇති වස්ත්‍ර), ගතපච්චාගත (සොහොනට ගිය මිනිසුන් ස්නානයෙන් පසු ඉවත් කළ වස්ත්‍ර), අග්ගිදඩ්ඪ (පිළිස්සීම නිසා ඉවත දැමූ වස්ත්‍ර), ගොඛායිත (ගවයින් කෑ වස්ත්‍ර), උපචික්ඛායිත (වේයන් කෑ වස්ත්‍ර), උන්දුරක්ඛායිත (මීයන් කෑ වස්ත්‍ර), අන්තච්ඡින්න

(කෙළවර කැඩී ගිය වස්ත්‍ර), දසාච්ඡින්න (දවාලූ කඩාගිය වස්ත්‍ර), ධජාහට (නැව්වල ඉවත් කළ කොඩි), ථූප චීවර (හුඹස්වල බලිකර්ම සඳහා බැඳි වස්ත්‍ර), සමණචීවර (භික්ෂු වස්ත්‍ර), ආභාසේකික (රජුන් අභිෂේක කළ ස්ථානවල අතහැරගිය වස්ත්‍ර), ඉද්ධිමය (ඒහි භික්ෂු චීවර), පන්ථික (අතරමග වැටුණු වස්ත්‍ර), වාතාහට (සුළඟින් ගසාගෙන ගිය වස්ත්‍ර), දේවදත්තිය (දෙවියන් දුන් වස්ත්‍ර), සාමුද්දිය (මුහුදු රළින් ගොඩගැසූ වස්ත්‍රය) යනු ඒවාය. පාංශුකූලික භික්ෂූන්ට ආරාම පිදීමේ ආරම්භය මානවම්ම රජුගේ කාලයේ (ක්‍රි. ව. 684 - 718) සිදුව ඇති බවට සාධක ලැබෙන අතර (මහාවංසය, දෙවන භාගය, 48 පරි. ගාථාව 04), පොළොන්නරු අවදිය පාංශුකූලිකයන් පිළිබඳ අවසන් වරට තොරතුරු හමුවන අවස්ථාව වේ. ආරණ්‍යවාසීන් පිළිබඳ ව මහාවිහාරයෙන් තොරතුරු ලැබෙන අතර හතරවැනි කාශ්‍යප රජු සමයේ සේන ඉලංග සෙනෙවියා විසින් මෙම භික්ෂූන්ට වනයෙහි ආශ්‍රමයක් ඉදිකොට ඇත (මහාවංසය, දෙවන භාගය, 61 පරි. ගාථාව 60).

**ලක්දිව සාමාන්‍යයෙන් දක්නට ලැබෙන පධානඝරයක ව්‍යුහාත්මක සැකැස්ම මෙසේය.**

ඉදිකිරීම සමතලා ගල් පර්වතයක් මුල් කොට ගෙන ගොඩනගා ඇත.

ගොඩනැගිල්ල කොටස් දෙකකින් (ද්විත්ව වේදිකා) යුක්ත ය.

සමස්ත ඉදිකිරීම ප්‍රාකාරයක් මගින් සීමා කොට ඇත. (ප්‍රාදේශීය පධානඝර හැර)

ගොඩනැගිල්ලේ පිටුපස වේදිකාව දිය අගලකින් වට කොට ඇත. (ස්වාභාවික ගල් තලාව අගලක් ලෙස හාරා නිර්මාණය කොට ඇත)

වේදිකා දෙක සම්බන්ධ කොට ඇත්තේ ගල් පාලමක් මගිනි.

වේදිකා දෙක ආයත චතුරස්‍රාකාර හෝ චතුරස්‍රාකාර හැඩයෙන් යුක්ත ය.

සීමා ප්‍රාකාරයට ඔබ්බෙන් දානශාලා, ජන්තාඝර, චංකමණඝර, වැසිකිළි, කැසිකිළි ආදිය පිහිටුවා ඇත.

උපරි භාගය දැවයෙන් තිබෙන්නට ඇත.

දැව කණු සඳහා ශක්තිය ලබා දීමට ගල් කුළුණු යොදන්නට ඇත.

ගොඩනැගිලි දෙක අතුරින් පළමුවැන්න සේනක බණ්ඩාරනායක මහතා මාලක වශයෙන් ද (Bandaranayeke 1974: 160) ගාමිණී විජේසූරිය මහතා අංගණ වශයෙන් ද හඳුන්වා දෙයි (Wijesuriya 1998: 200).

රිටිගල සහ මානාකන්ද යන ස්ථානවල දෙවැනි වේදිකාව පස් බිම මත ශිලා ස්ථම්භ පිහිටුවා ඒ මත බිම සකස් කොට ඇති බව පැහැදිලි වේ. අත්තිවාරම පැහැදිළිව දැකගත හැකි මෙහි ඇතුල්විය හැකි ආකාරයට කවුළුවක් ඉතිරිකොට ඇත. ඇතැම් විට දෙවැනි වේදිකාවේ භූමිය දැව ඇතිරීම මගින් සකස් කොටගෙන තිබෙන්නට ඇත. එසේ ම ගොඩනැගිලි දෙක යා කෙරෙන ගල් පාලම පියස්සක් මගින් ආවරණය කොට තිබූ ලකුණු අනුරාධපුර බටහිරාරාම පධානඝර සංකීර්ණයෙන් හඳුනාගෙන ඇත (අමරසේකර 2013: 84). කැසිකිළි ගල්, ගොඩනැගිල්ල හා සීමා ප්‍රාකාරය අතර විවෘත කොටසෙහි දැකිය හැකිය. අනුරාධපුර බටහිරාරාමය ආශ්‍රිත ව කැසිකිළි ගලට අමතර ව මුහුණලා

වාඩිවන ස්ථානය ඉදිරිපිට තිරස් ව කැටයම් සහිත ගල් පුවරුවක් ද දැකිය හැකිය. නමුත් රිටිගල එවැන්නක් දක්නට නොමැත. සීමා ප්‍රාකාරය බොහෝ පධානඝරවල දක්නට ලැබෙන ලක්ෂණයක් වුවත් ඇතැම් ඒවායේ එය දැකිය නොහැකිය. ජන්තාඝර ගොඩනැගිල්ලේ මැටි ඔරු, සුවඳ කවන ලද මැටි, ඇඹරුම්ගල්, ජල භාජන ආදිය ද තිබූ බවට සාධක හමුවේ. අරන්කැලේ ආරාම සංකීර්ණයේ ජන්තාඝරයෙහි දොරටු හා ජනේල පැහැදිලි ව හඳුනාගත හැකිය.

පොකුණු හා පොකුණු බැම්ම

පිහිටි ගල අගලක් ආකාරයට හාරා එහි අඩු ලුහුඩු ස්ථාන සකස් කරන ලද ගල්වලින් බැමි බැඳ දිය අගල් සකස් කොට තිබේ.

පොකුණු ඉදිකිරීමේ අරමුණු කිහිපයකි.


ජල පරිභෝජනය

අනවශ්‍ය ලෙස එකතුවන ජලය එක්රැස් කිරීම

වැසි කාලයේ තැන තැන එකතුවන ජලය ක්‍රමානුකූල ව එකතැනකට එකතු කිරීම (අමරසේකර 2013: 104)

පධානඝර ආශ්‍රිත ව ඇති කැසිකිළි ගල් යනුවෙන් අර්ථකථනය වී ඇති කැටයම් සහිත ගල් පුවරු ද විශේෂ ය. චාල්ස් ගොඩකුඹුර මහතාගේ අදහස වන්නේ මේවා වෙනත් ගොඩනැගිල්ලකින් රැගෙනවිත් තැන්පත් කළ බැවින් කැටයම් සහිත ව දැකගත හැකි බවයි. බද්දේගම විමලවංශ හිමියන්ගේ අදහස වන්නේ මේවා කැසිකිළි නොවන බවයි (විමලවංස හිමි 1992: 10). උන්වහනසේගේ තර්කය වන්නේ මේවා කැසිකිළිගල් නම් බෞද්ධ සංස්කෘතියෙහි විශේෂ තැනක් ගන්නා "විමාන" මේවායෙහි සංකේතවත් නොකරන බවයි. එබැවින් උන්වහන්සේ මේවා මහායානික භික්ෂූන් උපසම්පදා කරන විට හිසට වත්කරන අභිෂේක ජලය ගලා යෑමට සකස් කළ පුවරුව බව පවසයි. මෙහි ඇති විමාන කැටයම් මහායානිකයින්ගේ සුඛාවතී විමානය බව උන්වහන්සේ සැක පහළ කරයි (විමලවංස හිමි 1992: 10). සංඝාධිසේසාදී නොයෙක් විනය නීති කඩ කළ භික්ෂූන් වහන්සේලා හුදෙකලා කිරීමෙන් පසු නැවත සංඝ සමාජයට ඇතුළත් කරගැනීමේ දී කහ දියර ආදිය ඉස ධොවනය කළ ස්ථානය මෙය බව විමල් විජේරත්නයන්ගේ අදහසයි (සම්මුඛ සාකච්ඡා). ඇතැමෙකුගේ අදහස වන්නේ මෙම කාලවකවානුව තුළ සැරසිලි ලෞකිකත්වයට වඩා නැඹුරු බැවින් ඒවා ලෝකෝත්තර අරමුණක් සහිත පුද්ගලයන්ගෙන් ප්‍රතික්ෂේප වූ බවයි. "...තමන් ප්‍රතිවේද කරගත් හෝ ප්‍රතිවේද කිරීමට උත්සා හදරන උදාර පරමාර්ථය හා සසඳා බලන කල කලා ශිල්පවලට හිමිවිය යුතු තැන ව්‍යංග ාර්ථයෙන් දැක්වූයේ වැසිකිළි පාදුකාවල කැටයම් කිරීම මගිනි..." (අමරසේකර 2013: 124).

බොහෝ ස්ථානවල පිටුපස ගොඩනැගිල්ල පිහිටි ගලකට බද්ධකොට තිබෙනු දැකිය හැකිය. නමුත් රිටිගල බොහෝ පධානඝරවල එම ලක්ෂණය දක්නට නොලැබේ.




**පධානඝරයක සැළසුම් (අංක 16 දරන පධානඝරය)**

අනතුරු ව සමස්ත ගොඩනැගිල්ල විශාල ප්‍රාකාරයකින් වටකොට තිබිණ. මෙහි පිටුපස කොටස භික්ෂූන් වහන්සේ වැඩ විසූ කුටිය ලෙසත්, ඉදිරිපස කොටස විවෘත ආලින්දයක් ලෙසත් පැවති බවට සැළකේ. මහාචාර්ය ටී. ජී. කුලතුංග මහතාගේ මතය වන්නේ මෙම ඉදිරිපස කොටස උපයෝගිතා කිහිපයකින් යුක්ත බවත් ඒ අතරින් ප්‍රධාන වශයෙන් ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා විසින් නවක භික්ෂූන් වහන්සේලාට කමටහන් දීම පිණිස භාවිත කරන්නට ඇති බවයි (කුලතුංග 1993 ජුලි-දෙසැම්බර්, 27 පිටුව). එසේ ම කුටි දෙක අතරින් ගොඩනැගිලි දෙක යා කෙරෙන පාලම දෙපසින් පහළට බැසීමට හැකි පරිදි දෙපසට නිර්මාණය කරන ලද පියගැට පේළි දෙක පිටතින් පැමිණෙන භික්ෂූන්ට සහ ඇතුළතින් බැහැරවන භික්ෂූන් වහන්සේලා සඳහා සකස් කොට තිබූ බවයි (-එම-).

භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලා අඛණ්ඩ ව භාවනා කිරීමේ දී ශරීරය සිහිල් ව පවත්වා ගැනීමට හා සත්ත්වයින්ගෙන් ආරක්ෂාව සළසා ගැනීමට දිය අගල උපකාරී වන්නට ඇත. ගොඩනැගිල්ල වටා ඉදිකළ දැවැන්ත ප්‍රාකාරයෙන් වන අලින් ඇතුළු ශක්තිමත් සතුන්ගෙන් ආරක්ෂාව සැපයෙන්නට ඇත. බොහෝ විට මේ අසල සක්මන් මළුවක් (චංකමණ පථ) ද පැවතිණ. රිටිගල බහුලව ම දැකිය හැකි ස්මාරක විශේෂය වන්නේ පදානඝර ය.




අංක 16 පධානඝරය

රිටිගල දක්නට ලැබෙන ඉදිකිරීම් පළමු වැනි සේන රජු විසින් (ක්‍රි. ව. 831-851) උග්‍ර භාවනානුයෝගී පාංශුකූලික භික්ෂූන් උදෙසා ඉදි කරවන ලද බවට සැළකේ. මේවායින් බොහෝ ප්‍රමාණයක් දැඩි, වන ගහණයෙන් වැසී පවතී. රිටිගල වැඩ විසූ භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමාණය විශාල බව එමගින් සනාථ වේ. මුල් කාලීන ව ලෙන්වල වැඩවිසූ භික්ෂූන් වහන්සේලාට සාපේක්ෂ ව පදානඝරයන්හි වැඩ විසූ භික්ෂූන් වහන්සේලා සංකීර්ණ වූ බව තර්කානුකූල ය.

පදානඝරය යනු කාමර දෙකකින් යුත් ගොඩනැගිල්ලක් වන බැවින් හා ක්‍රි. ව. 09 වන සියවස සමාජයේ දියුණු ලක්ෂණ පෙන්වන බැවිනි. නමුත් පදානඝරය ද ඉතා සරල


උපකරණ කිහිපයකට සීමා වන්නට ඇත. ඇඳ, කොස්ස(ස්වාභාවික අමුද්‍රව්‍ය), පාපිස්නාව, පඩික්කම, පැන් කලයක් හා කෝප්පයක් ඒ අතර තිබෙන්නට ඇත. අටපිරිකරට අයත් භාණ්ඩ (තනිපට සිවුර, දෙපට සිවුර, අඳන සිවුර, පටිය, පාත්‍රය, දැලිපිහිය, පෙරහන්කඩය, ඉඳිකටු සහ නූල් ) සහ කුඩයක් යනාදිය එම භික්ෂූන් වහන්සේලාගේ පරිහරණ ද්‍රව්‍ය වන්නට ඇත. ක්‍රි. ව. පස්වැනි සියවසින් පමණ පසු බෞද්ධාරාම නඩත්තුව සඳහා වැව්, කෙත්වතු ආදිය විහාරස්ථානවලට පුදා ඇති අතර ඒවා නඩත්තුවට පුද්ගලයන් පත්කොට ඇත. නවකම්ම (අලුත් ගොඩනැගිලි ඉදිකිරීම භාර නිලධාරියා), භාජක වාරික (උපකරණ පාලක), උපධිභාර (වෙනත් විහාරාරාමවල කලමණාකරු), මුණ්ඩ සේනාසන වාරික (පැවරූ පදිංචි නැති ආරාම පාලක), සලාක සභාපක (සලාක පිළියෙළ කරන්නා), පරිසණ්ඩ වාරික (උයන්වතු පාලක) එවැනි තනතුරු කිහිපයකි (ගුණවර්ධන 2010:24). මෙතරම් විශාල විහාරස්ථානයක එවැන්නවුන් නොසිටින්නට ඇතැයි සිතීම අපහසු ය. රිටිගල පධානඝර දිවයිනේ වෙනත් ස්ථානවල පිහිටි පදානඝර ආකෘතියෙන් තරමක් වෙනස් ය. ඒවායෙහි ගොඩනැගිලි වටා දිය අගලක් නොමැති වීම විශේෂ වන අතර, අලංකාර මෝස්තර භාවිත කළ එක ම ස්ථානය වන්නේ කැසිකිළිය පමණි. පදානඝර සහිත බොහෝ ස්ථානවල කැසිකිළි පමණක් මෝස්තර නෙළීම විශේෂ කරුණකි. රිටිගල ගොඩනැගිලිවල බොරදම් ඉතා සරල වන අතර ඊට සමාන බොරදම් මුල්ලේගල ද දක්නට ලැබේ.

රිටිගල පධානඝර මටසිලිටි ලෙස සකස් කරන ලද ශිලාමය නිර්මාණ වේ. මේ සඳහා භාවිත ශිලා පුවරු අති දැවැන්ත ය. මේවා රිටිගල පර්වතයෙන් ම කඩාගත් ඒවා බවට සාධක ගල් පර්වත ආශ්‍රිත ව දැකිය හැකිය.





PLAN.

Building 31
*Scale, 12 Feet to an Inch.*




ELEVATION(NORTH)



SECTION THROUGH A.B.

Building 31 A
*Scale, 08 Feet to an Inch.*




**රිටිගල ගොඩනැගිලිවල බොරදම්**

රිටිගල පධානඝර සහිත ගොඩනැගිලි කිහිපයක ශිලා පුවරුවලින් නිර්මාණය කළ ඉතා විශේෂිත පිහිළි දක්නට ලැබේ. මේවා පධානඝර සහිත ගල වටා කවාකාර ව ගල් මත ඉදි කොට ඇති අතර ජලය වැස්සෙන පරිදි ගලෙන් බාහිරට සිටින සේ පිහිළි ආකාරයට නිර්මාණය කොට ඇත. මේවා ජලමල් ආකාරයෙන් තිබුණේ ද වෙනත් උපයෝගිතාවක් සඳහා පිහිටුවන ලද්දේ ද යන්න පැහැදිලි නැත. මේ සඳහා බාහිරින් ජලය රැගෙන ආවේද යන්න සොයා ගැනීම සඳහා කැණීම් සිදු කළ යුතුය.



**ජල මලක ස්වරූපය දරන පිහිළි සහිත පධානඝරයක්**



**එම පධානඝරයෙහි සැළසුම්**

### සමාලෝචනය

ශ්‍රී ලංකාවේ මෙතෙක් හඳුනාගෙන ඇති පධානඝර ආශ්‍රයෙන් ලබා ඇති දැනුම සම්පිණ්ඩනය කිරීමේ දී රිටිගල පධානඝරයන්හි විශේෂිත ලක්ෂණ කිහිපයක් ම හඳුනාගත හැකිය. පරිසරයේ ස්වරූපයට අනුගත වෙමින් පධානඝර ආකෘතිය තරමක් වෙනස් කර ඇති අතර, ඇතැම් කරුණු පිළිබඳ ව මේ වන විටත් මතවාද පවතී. වාස්තුවිද්‍යාත්මක ව මෙම ඉදිකිරීම්වල සැලසුම් ලෝකයේ වෙනත් ස්ථානවලින් හමුනොවන ඉදිකිරීම් බැවින් මෙම ඉදිකිරීම් සම්ප්‍රදාය පිළිබඳ ව වැඩිදුර අවධානය යොමුකළ යුතුය. විනය අනුව භික්ෂූන්ගේ කුටි සකස් කර ගැනීම සිදුවිය යුතු ආකාරය හා ඒවා නඩත්තු කළයුතු ආකාරය පැහැදිළි ව විස්තර කර ඇති බැවින්, චුල්ලවග්ගපාලිය වැනි මූලාශ්‍රයවල සඳහන් නොවූව ද මෙම ගොඩනැගිලි ද භික්ෂූන්ගේ වත්පිළිවෙත් සඳහා භාවිත කර ඇති බව පුරාවිද්‍යාත්මක ව මෙන් ම වෙනත් ලිඛිත මූලාශ්‍රයවලින් ද තහවුරු වන බව ඉහත දැක්විණ. මෙම ගොඩනැගිලි දින නිර්ණය කිරීමට මහාවංසය හා අනෙකුත් මූලාශ්‍රයවලින් මහඟු පිටුබලයක් ලැබේ. පධානඝර සියවස් කිහිපයකට සීමා වීම පිළබඳ ව විවිධ අදහස් පවතින අතර, ඉතිහාසය දෙස ආපසු හැරී බැලීමේ දී ලංකාවේ බිහි වූ බොහෝ සම්ප්‍රදායන් සියවස් කිහිපයකට සීමා වී පැවතීම සාමාන්‍ය තත්ත්වයක් බව තහවුරු වේ. එක් එක් වර්ගයන්ට අයත් ශිලා ලේඛන, ටැම්පිට විහාර, ලෙන් විහාර ආදිය ඊට නිදසුන් ය. රිටිගල පධානඝර එක් ස්ථානයක පොකුරුගත වී ඇති විශාලතම පධානඝර සංකීර්ණයක් වන බැවින් මෙහි භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමාණය පිලිබඳව ද අදහසක් ලබාගත හැකිව පවතී.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ඌණ පූරණ සහිතො මහාවංසො, 1959, බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

පාලි සිංහල අකාරාදිය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, 1998, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

සාරත්ථදීපිකා නම් රසවාහිනී ටීකා, 1907, ලේල්වල සිරිනිවාස (සංස්), ජිනාලංකාර මුද්‍රණාලය.

සිංහල විසුද්ධිමාර්ගය, 1928, (පරි) ධම්මවංස හිමි, කාල්ටන් මුද්‍රණාලය, මාතර.

අමරසේකර, සස්නි, 2013, අනුරාධපුර බටහිර ආරාම;පධානඝර සංකීර්ණය, කර්තෘ ප්‍රකාශන.

ගුණවර්ධන, ප්‍රිශාන්ත, 2010, ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ සංඝාරාම, සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජාඇල.

සම්මුඛ සාකච්ඡා - සේවාර්ජිත මහාචාර්ය විමල් විජේරත්න සමග 2021 අප්‍රේල් මස 20 වැනි දින සිදු කරන ලද සාකච්ඡාව.

Bandaranayeke, S, 1974, Sinhalese Monastic Architecture, E. G. Brill, London

Bell, H C P, 1914, Archaeological Survey of Ceylon (ASCAR) 1893 annual report, Government printer, Ceylon.

Bell, H C P, 1904, north central and Sabaragamuwa province, (sessional paper) Archaeological Survey of Ceylon 1893 annual report, Government printer, Ceylon.

W. R. McAlpine, (පරි : උදිත ප්‍රසන්න අලහකෝන්) 2002, රිටිගල, මධ්‍යම සංස්කෘතික අරමුදල